යම් සිදුවීමක් වාර්තා කිරීමේදී කිසිදු පාර්ශවයක් නොගනිමින්, පූර්ව විනිශ්චයන් ලබා නොදෙමින්, එම පුවතට අදාළ සියලු දෙනා හට නිසි මානුෂීය ගරුත්වය ලබාදෙමින් සමබරව වාර්තා කටයුතු කිරීම, මාධ්‍යයේ ක්‍රියාකලාපය විය යුතු නොවන්නේදැයි, පාඨක අප නිරන්තරයෙන්ම ඇසිය යුතුයි. එම පැනය නැගීම සඳහා අපට මාධ්‍ය ඔස්සේම විවිධ ප්‍රස්තුතයන්ද මුණගැසේ.

මව්බිම (පෙබරවාරි 22,2022) සහ දිනමිණ (පෙබරවාරි 22, 2022) යන පුවත්පත් දෙකෙහිම මාදුරුඔය ජාතික වනෝද්‍යානයේ සත්ත්ව දඩයමේ යෙදී සිටි පිරිසක් අත්අඩංගුවට ගැනීමක් වාර්තා කර තිබුණි. ඒ පිළිබඳ පුවත් වාර්තාවන් හි සිරස්තල යෙදී තිබුණේ මෙසේයි:

මව්බිම : මාදුරුඔයේදී මස්වැද්දන් පස් දෙනෙක් දැලේ
දිනමිණ : මාදුරුඔය රක්ෂිතයේ දඩයක්කරුවෝ කොටු

1) “මස් වැද්දන්" වැනි නිශේධාත්මක යෙදුම් මාධ්‍ය තුළ භාවිතා කිරීම කෙතරම් යෝග්‍ය භාෂා භාවිතයක් වන්නේද?

2) වරද කුමක් වුවත්, එවැනි යෙදුම් හරහා ඍණාත්මක ලේබල් ගත කිරීම් ඇති නොවන්නේද?